18/07/2010 - ඉරිදා ලංකාදීප

**සැලසුම් කිරීමේ කිරිබත් කලාව - මිලින්ද මොරගොඩ**

දුටු ගැමුණු කුමාරයා යුද්ධයට ගිය තරුණ අවධියේ දී කුඩා හමුදා සේනාංකයක් හදාගෙන තැනින් තැනින් පහර දී ශක්තිමත් එළාර රජු පරාජය කරන්නට උත්සාහ කළේය. පරාජය වී හුදෙකලාව වනාන්තරයේ අතරමංවූ දුටු ගැමුණු කුමාරයාට නොදන්නා කාන්තාවක් යුද්ධය කළමනාකරණය කිරීමේ පාඩම කියා දී ඇත. කුසගින්නේ සිටි කුමාරයා තමන්ට ආහාරයට දුන් කිරිබත් පිඟානේ උණු බත් අතට ගැනීමට නොහැකිව තැනින් තැනින් ඇඟිලි ගහමින් සිටින අයුරු දුටු මේ මහලු කාන්තාව මුහුණට ම කියා ඇත්තේ ''දුටුගැමුණු කුමාරයා යුද්ධ කරනවා වගේ''යැයි කියාය. බත් පිඬු පිඟාන වටේ තැනින් තැන තබා ඒවා නිවුණ පසු එකින් එක එකවර ආහාරයට ගෙන කුසගිනි නිවා ගන්නා අන්දම ඉගෙන ගැනීමෙන් පසු සේනාංක සංවිධානය කර තැනින් තැනින් වට කර එකවර පහර දී එළාර රජු පරාජය කර ශ්‍රී ලංකාව එක් සේසත්කරන්නට දුටු ගැමුණු කුමාරයා සමත්විය.

මෙයින් පෙන්වන්නේ සැලසුමක ඇති වැදගත්කමයි. සැලසුම තිබුණේ මහලු කාන්තාව ගේ හිත තුළය. එහෙත් ක්‍රියාවට නැගුවේ දුටුගැමුණු කුමාරයාය. කොපමණ සැලසුම් තිබුණත් ඒවා ක්‍රියාවට නැගෙන්නේ නැතිනම් පළක් නැත. ශ්‍රී ලංකාව ඕනෑ තරම් සැලසුම් ඇති රටකි. සැලසුම් හදන්නට දක්ෂ නිලධාරීන් පිරිසක් ද රටට සිටී. ඔවුහු දක්ෂය. සමීක්ෂණ කරමින් දත්ත උපයෝගී කරගනිමින් සැලසුම් සකස් කරයි. මේවා කරන්නේ දේශපාලන උවමනාව අනුවය. බලයට පත්වන ආණ්ඩු අලුත් අදහස් ගෙන එයි. ඒවා සුන්දර සංකල්ප බව ඇත්තකි. නිලධාරීහු මේ සුන්දර සංකල්ප වටා සැලසුම් සකස් කරයි. තුන් අවුරුදු, පස් අවුරුදු වශයෙන් ඒ සැලසුම් කඩදාසිවල ඉදිරිපත් කෙරේ. සාකච්ඡා වට ගණන් පවත්වා ඉතාම සූක්ෂම සැලසුම සකස් වන විට ආණ්ඩුවේ ආයු කාලය හමාරය. එහෙම නැතිනම් කැබිනට් සංශෝධනයකින් විෂය භාර අමාත්‍යවරයා මාරුවී ඇත. අලුතෙන් පත්වන අමාත්‍යවරයා උත්සාහ කරන්නේ ද තමන්ට අවශ්‍ය සැලසුම අනුව අලුත් සංවර්ධන වැඩ සටහන් සකස් කරන්නටය. අධෛර්යවත් නොවන නිලධාරීන් මුලින් හැදූ සැලසුම අකා මකා දමා තවත් සැලසුමක් සකස් කරන්නට පටන් ගනී. සැලසුම් සකස් කරන නිලධාරීන් ද එයට දක්වන්නේ කැමැත්තකි. වැඩක් කරන බව පෙන්වන්නට හැකිය. වැඩි අවදානමක් හෝ වගකීමක් ද නැත. දොසක් අහන්නටත් සිදුනොවේ. මේ නිසා සැලසුම් හදයි. වියදම් වැඩි වෙයි. වැය ශීර්ෂ වෙනස් වෙයි. නිලධාරී දීමනා හා පහසුකම් වැඩි කෙරෙයි. නමුත් අවසානයේ ඒ සැලසුමත් ක්‍රියාත්මක වන්නේනම් නැත.

නිදහස ලැබූ දා පටන් ශ්‍රී ලංකාවේ සංවර්ධනය වෙනුවෙන් හැදූ සැලසුම් ක්‍රියාත්මක වූවා නම් අද මේ රට ඉසුරුමත් කේතුමතී රාජධානියයි. මහජනතාව සතුටින් හා සාමයෙන් ජීවත් වන රටයි. මේ සැලසුම් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පමණක් ඇති කරන ලද අලුත් ආයතන අරමුණු අනුව ක්‍රියාත්මක වූවා නම් අවුරුදු හැටකට පසුවත් සැලසුම් හා ඒවා ක්‍රියාත්මක කිරීම ගැන කතා කරන්නට රටට අවශ්‍ය නැත. ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලනයේ පවතින ප්‍රධාන දුර්වලතාවය මෙයයි.

සැලසුම් හදන්නට දක්ෂ නිලධාරීන් තීන්දු ගන්නේ නැත. තීන්දු ගැනීම අවදානම් එකකි. එයින් වැරැද්දක් වුවහොත් දොස් අහන්නට වෙන්නේ තමන්ට බව සිතන අතර තීන්දු ගැනීම දිනෙන් දින කල් දමයි. සංවර්ධන යෝජනා ක්‍රමයක් කල් දැමීමෙන් නිලධාරීන්ට අවාසියක් වන්නේ නැත. අවාසිය වෙන්නේ එහි ප්‍රයෝජන හිමිවන රටටය. මහජනතාවටය. දේශපාලන චෝදනා, ආණ්ඩුවේ නීති රීති, නොයෙකුත් කොමිෂන් හා අධිකරණ තීන්දු නිසා නිලධාරීන්ගේ තීන්දු ගැනීමේ මානසිකත්වය ක්‍රමයෙන් හීන වී තිබේ. මෙම ක්‍රමය ඇති කළේ දේශපාලනයයි. අලුතින් බලයට පත්වන ආණ්ඩුව පැවති ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රසිද්ධියේ හෙලා දකින අතර ඒවාට සම්බන්ධ වී සිටි නිලධාරීන්ගේ ආත්ම ගරුත්වය පලුදු වන අන්දමට චෝදනා කරයි. මෙම චෝදනා හා වැරදි පෙන්වාදීම ආන්ඩුවක් පත්වන විට පමණක් නොව අමාත්‍යවරයෙක් වෙනස් වූ විට පවා ඇතිවන සාමාන්‍ය තත්ත්වයක් බවට දැන් පත්ව තිබේ. මෙයින් රටට

යහපතක් වී නැත. නිලධාරීන් බිය වී නිහඬ වැඩක් නොකර සිටීමේ තත්ත්වයක් දක්වා හුරු වෙන්නට පමණක් එය ප්‍රයෝජනවත් වී ඇත. ජන්මයෙන්ම උදාසීන පුද්ගලයෙකුට වඩා උවමනාවෙන් උදාසීන වූ පුද්ගලයෙකුගෙන් කාර්යක්ෂම පාලනයක් අපේක්ෂා කළ නොහැකිය. නිදහසින් පසු ගතවූ කාලය තුළ බිහිකර ඇත්තේ සැලසුම් හදන්නට දක්ෂ, තීරණයක් ගන්නට උනන්දුවක් නැති යාන්ත්‍රණයකි. මෙම සැලසුම් හදන්නට දක්ෂ තීරණ නොගන්නා පාලනය තීරණ ගන්නා ඒ නිසා රට දියුණු වන පරිසරයක් දක්වා ආපසු හැරවීම අවශ්‍යය. එය පහසු දෙයක් නොවේ. විශ්වාසය එහිදී ඉතාම වැදගත්ය. තීරණ ගැනීමට සුදුසු ආයතනික පරිසරයක් රට තුළ ඇතිකළ යුතුය.

ලෝකයේ ඕනෑම රටක සාර්ථකත්වයේ රහස බවට පත් වූයේ ක්‍රියාත්මක වීමයි. සැලසුම වැදගත්ය. එහෙත් සැලසුම පමණක් ම වැදගත් නැත. මහවැලි ව්‍යාපාරය අවුරුදු තිහක සැලසුමකි. එය අවුරුදු පහකින් ක්‍රියාත්මක විය යුතුයැයි ගත් තීරණය දඩබ්බර එකකි. අමාත්‍යංශයක් පිහිටුවිය. ඉක්මනින් තීන්දු ගත්තේය. වැඩ කළේය. විරෝධතා ඇතිවිය. විපක්ෂ දේශපාලන අදහස් ඇති පිරිස චෝදනා කළේය. මඩ ගැසීම් හා උපහාස සීමාවක් නොවීය. මහවැලි ව්‍යාපාරය අවුරුදු තිහකින් සැලසුම් කළානම් මහවැලි යෝජනා ක්‍රමය අදටත් අවසන් නැත. මහවැලිය අවසන් වීමෙන් පසු ඇති කළ ගංගා ආශ්‍රිත සංවර්ධන යෝජනා ක්‍රම රටට ආර්ථික සංවර්ධනය ගෙන ආවේය.  කෘෂිකර්මය දියුණු කළේය. විදුලි බලය නිපදවීය. තාජ් හෝටලය, හිල්ටන් හෝටලය, නවලෝක රෝහල හා ලෝක වෙළඳ මධ්‍යස්ථානය වැනි මේ රටේ ව්‍යාපාරික සංකේත අවුරුදු ගණන් හිතා බලා සැලසුම් කර ගත් ප්‍රතිපත්ති තීරණ නොවේ. මෙවැනි උදාහරණ මේ රටෙන් උවමනා තරම් සොයා ගත හැකිය. කෙරවලපිටිය විදුලි බලාගාරය, ඉහල කොත්මලේ විදුලි බලාගාරය, ඔලුවිල් වරාය අවුරුදු ගණන් සාකච්ඡා කරමින්, තර්ක කරමින් සැලසුම් සකස් කළ ව්‍යාපෘතීන්ය. මේවා ගැන තීන්දු ගත්තේ නැත. දේශපාලන හා සමාජ විරෝධතා නිසා අවුරුදු ගණන් ඒවායේ ඉදිකිරීම් ප්‍රමාද විය. එයින් රටට සිදුවූ ආර්ථික හානිය විශාලය. වත්මන් රජය මෙම ව්‍යාපෘති ගැන කඩිනම් තීන්දු ගැනීමත් සමග මෙම ව්‍යාපෘති රටේ සංවර්ධනය වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්නට පටන් ගෙන තිබේ.

මහජනතාව ආණ්ඩුවට බලය පවරන්නේ වැඩක් කරන්නටය. සියලු දේ සියලුම ආකාරයෙන් සර්වප්‍රකාරයෙන් සාර්ථක විය නොහැකි බව මහජනතාව දනී. නමුත් දේශපාලනය කරන්නේ මහජනතාව දන්නා මේ යථාර්ථය විකෘති කර මහා විනාශයක් බව ඔප්පු කිරීමයි. තීරණ දහයක් ගන්නා විට එයින් දහයෙන් දහයම හරියට කරන්නට ලැබෙන අවස්ථාව නැත. මේ දහයම ඉතාම නිවැරදිව කරන්නට අවුරුදු ගණන් සැලසුම් කළ හැකිය. දන්නා අන්දමට දහයෙන් එකක් හෝ ඉක්මනින් ක්‍රියාවට නැගෙන්නේ නම් එහි වාසිය ලැබෙන්නේ රටට හා ජනතාවටයි. පාරක් අලුතින් කැපෙනවිට, විදුලි බලාගාරයක් බිහිවන විට, වරායක් හදන විට ඇතිවෙන්නේ වෙනසකි. වෙනස්කම් වලට මුහුණ දෙන්නට සූදානම් නැති පිරිස එයට විරුද්ධවෙයි. තමන්ට අවාසියක් වෙන බව සිතන කණ්ඩායම ද එයට එකතුවෙයි. මේ නිසා විරෝධතා ඇතිවෙයි. දූෂණය, වංචාව හා රට විනාශ කිරීම ගැන කතා කරන්නට පටන්ගනී. චෝදනාවලට මුහුණ දීම අභියෝගයකි. නායකයන්ට එයට ශක්තිය තිබිය යුතුය. අවලාද හා ප්‍රතිවිරෝධතා වලට ආත්ම ශක්තියෙන් යුතුව නිර්භීතව මුහුණ දී වෙනස්කමක් වෙනුවෙන් පෙනී සිටි නායකයන් නිසා ලෝකයේ මුහුණුවර හැමදාමත් අලුත් වූ බව අමතක කළ යුතු නැත. වැරදීම් පාඩමක් කරගනිමින් අලුත් දේ සොයා ගිය නායකයෝ රටවල් ගොඩ නැගූහ. මහජනතාවගේ ජීවිත සමෘද්ධිමත් කළහ. වෙනසක් නොකර අම්හිරි තීන්දු ගැනීමෙන් වැලකී ජනප්‍රිය නායකයෙකු ලෙස බලයේ සිටීම පහසු එකකි. නායකයන් නිතර අවධානමට මුහුණ දෙන්නට හුරු විය යුතුය. අභියෝග මැද තීන්දු ගනිමින් මහජනතාවට වඩා දුර දකින නායකයන් පාලන කාලයේ දී ජනප්‍රිය නැති නමුත් ඔහු ගේ තීන්දු අනුව ප්‍රතිඵල ලබන විට අතීතයේ මෙවැනි තීරණ ගත් පාලකයෙකු සිටි බවට මහජනතාවගේ ගෞරවයට පාත්‍රවෙයි. රටකට අවශ්‍ය ජනප්‍රිය නායකයන් නොව අනාගතයේ මහජනතාවගේ ගරු බුහුමනට පත්වන නායකයන්ය.

ප්‍රජාතන්ත්‍රවාදය අනුව පාලනය සම්බන්ධයෙන් නීති රීති හා රෙගුලාසි තිබේ. මූල්‍ය නීති එයටත් වඩා වැඩිය. මේ නීති උල්ලංඝනය වුවහොත් දඬුවමක් ඇත. නමුත් මේ නීති වර්තමානයට ගැලපෙන ඒවා නොවේ. මෙරට දැන් ඇති ඇතැම් මූල්‍ය නීති දෙවන මහා ලෝක යුද්ධය සමයේ පනවන ලද ඒවාය. ලෝකය අද ඇතුල් වී ඇත්තේ තාක්ෂණ යුගයටය. පරිගණකයෙන් තොරතුරු තාක්ෂණයෙන් තීන්දු ගත හැකිව තිබියදී එයට බලපාන්නේ දෙවන ලෝක යුධ සමයේ බලපවත්වන ලද මූල්‍ය නීති නම් මේවායේ ගැලපීමක් නැත.

මහජනතාව ආණ්ඩුව ගන්නා තීරණ ගැන බලාසිටියි. ආණ්ඩුව ප්‍රතිපත්ති සම්පාදනය කර ක්‍රියාත්මක වන්නට ඉඩ දුන්නේ නැතිනම් වෙනසක් සිදුනොවේ. වර්තමානයේ ආර්ථිකය සමාජයක වැදගත්ම සාධකයයි. ආණ්ඩුවලට වඩා ආර්ථික ක්‍රියාවලියෙහි දක්ෂ පෞද්ගලික අංශය බවට විශ්වාසයක් තිබේ. එය ඇත්තකි. පුද්ගලික අංශයේ ආයතන ඉක්මනින් කතා කර ඉක්මනින් තීන්දුගනී. රජයේ අවසරය හෝ අණ පනත් බලපෑම නිසා පුද්ගලික අංශයේ ව්‍යාපාර පවා මෙහෙයැවීම අඩපනවන අවස්ථා එමටය. ආණ්ඩුවට වඩා පුද්ගලික අංශයේ ආයතන දක්ෂ හා ඉක්මනින් ක්‍රියාත්මක වන බව මහජනතාව සිතන්නේ ඇයි. එහි රහස වගකීම අතට ගෙන ක්‍රියාත්මක වීමයි. කර්මාන්ත හා ව්‍යාපාර පවත්වාගෙන යන විට ඒවායේ පාලකයන් අතින් වැරදි සිදුවෙයි. අවාසිදායක තීන්දු ගනී. නමුත් ව්‍යාපාරිකයන්ගේ සාර්ථකත්වයට බලපා ඇත්තේ වරදින ඒ අවස්ථාවට වඩා අවදානම ද්‍රීන ද්‍රීනත් ගන්නා තීන්දු නිසා ඇතිවන වාසිදායක තත්ත්වයයි. අද දියුණුවට පත්ව ඇති ජාත්‍යන්තර සමාගම් තමන්ගේ ආයතනයන්හි ප්‍රධාන නිලධාරීන් වශයෙන් බඳවා ගන්නා විට විශේෂයෙන් සලකා බලන්නේ එම නිලධාරීන්ගේ කාර්ය සාධනයයි. තීන්දු ගැනීම එහි ඉක්මන් හා ඵලදායකත්වය ගැඹුරින් සොයා බලයි. ලංකාවේ රජයේ සේවයේ සිටින නිලධාරීන් උනන්දු වන්නේ තමන්ගේ නම ආරක්ෂා කරගෙන නිවී සැනසිල්ලේ විශ්‍රාම ගොස් කාගෙන්වත් දොසක් නොඅසා ජීවත්වීම ගැනයි.

මේ ආකල්ප වෙනස් විය යුතුය. සැලසුම් සමග ක්‍රියාත්මකවීම ගැන රජය අවධානය යොමු කළ යුතුය. හැම අවස්ථාවකම අලුතින් ආයතන පිහිටුවා නිලධාරීන් පත්කර සැලසුම් හා කාර්ය සාධන වාර්තා ගැන උනන්දුවීම තරමට වැඩක් කිරීම ගැනත් සැලකිල්ල දැක්විය යුතුය.

වර්තමානයේ අලුත් සංවර්ධන සැලසුමක් ගැන කතාකරන විටම එහි ප්‍රධානියෙකු හා කාර්ය මණ්ඩලයක් සහිතව ආයතනයක් බිහිවෙයි. අවුරුදු හැටක් තිස්සේ පිහිටුවන ලද එවැනි ආයතන අදටත් මහජන මුදල් නාස්ති කරමින් යහතින් පවතී. රාජ්‍ය ආයතන ලේඛනය බලන විට ඒවායේ ආයතන බිහිවෙනවා විනා කිසි දිනක වසා දමන්නේ නැත. පුද්ගලික අංශයේ සමාගම්වල ව්‍යාපාර ලියා පදිංචි කරන අතර කාර්ය භාරය අවසන් වනවා සමග ඒවා වසා දමයි. අද රටට අවශ්‍යව ඇත්තේ මෙවැනි තීන්දු ගන්නා සමාජ ප්‍රවාහයකි.